# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2025 මැයි මස 16 වන දින**
**II වන කොටස**

## අතිරේකය

(2025.05.20 වන දින නිකුත් කරන ලදී)

## සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන)

**2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මෙම වගන්තිය මගින් 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 2025 මාර්තු මස 31 වන දින සිට බලපවත්වන පරිදි අයවැය සහන දීමනාව ගෙවීම නැවැත්වීම ය.

එල්.ඩී.- ඕ 20/2025

## 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2025 අංක  දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන, 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2005 අංක 36 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**2**. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 3 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ “ 2005 අගෝස්තු මස 1 වන දින සිට බලපවත්වන පරිදි ” යන වචන වෙනුවට “2005 අගෝස්තු මස 1 දිනෙන් ආරම්භ වී 2025 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා,” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2 - PL 15220 - 465 (2025/05)